# වැලිමඩ ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීම් වාර්තාව - 2025.09.25

**පිළිගැනීම**

2025 වර්ෂයේ සැප්තැම්බර් මස 25 වන බ්‍රහස්පතින්දා දින පෙ.ව.09.05 ට මුලාසනය දැරූ ගරු සභාපතිතුමා විසින් ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රී මණ්ඩලය , සභා ලේකම්තුමා , කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදි මහතුන් ඇතුළු සියළු දෙනා පිළිගැනීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

**පැමිණීම**

**සහභාගි වූ ගරු මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය**

1. ගරු සභාපති ඩී.එම්. අජිත් කුමාර මැතිතුමා
2. ගරු උපසභාපති එම්.එල්.එම්. සෆ්වාන් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.දයාරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.එන්.කුසුම් කුමාරි මැතිණිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් හලීම් මොහොමඩ් ෆායිස් සයිබු මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් ප්‍රේමලාල් මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටි.එම්.චන්ද්‍රිකා තෙන්නකොන් මැතිණිය
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ප්‍රියන්ත චාමින්ද මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. මහේෂ් කෝසල රාජකරුණා මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සරත් කුමාර රාජපක්ෂ මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.දූෂාන්ත ඉන්දික රන්දෙණිය මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ. චන්දක වීරසේන මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.කේ. ලලිත් පද්මසිරි විජය නන්ද මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. උදයකුමාර් මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී. චිත්‍රා ජයසිංහ පතිරණ මැතිණිය
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.එම්.පී.ජමිත් මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්. චාමලී තුෂාරිකා ප්‍රනාන්දු මැතිණිය
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී. ධනුෂ්ක තිලකසිරි මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එනස්ට් ඩෙන්සිල් ස්ලේඩන් මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. චන්ද්‍රසේකර මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එම්. කරුණාදාස මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. චාමර ප්‍රසාද් ගුණසේකර මැතිතුමා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රාසීක් මැතිතුමා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. එම්. හුසෙයින් මැතිතුමා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඥානපාල සේනාධීර මැතිතුමා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. ප්‍රේමරත්න මැතිතුමා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. දනිෂා මැතිණිය
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. මුත්තුකුමාර් මැතිතුමා
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. පත්මිණි දිසානායක මැතිණිය
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සිත්ති උසෙයිමා මැතිණිය
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. වසන්ත කුමාරන් මැතිතුමා
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එච්. අබ්දුල් හසීම් මැතිතුමා

35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. තාහිර් මහරූෆ් මැතිතුමා
36. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජබාර් තුවාන්කාසිම් මැතිතුමා
37. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සිසිර දිලාන් ජයතිලක මැතිතුමා
38. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.ඩී. අමිත අමරසූරිය මැතිතුමා
39. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී. චූලනී ජයමාලි මැතිණිය
40. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.සෝමසිරි බණ්ඩාර මැතිතුමා
41. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ශාන්තා ප්‍රසාදි දේශානි මැතිණිය
42.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. කුසුමාවතී මැතිණිය

**නොපැමිණි**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්.ඉන්දික සම්පත් මැතිතුමා
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ඉන්දික සේනාරත්න මැතිතුමා

**01.පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරිම .**

ගරු සභාපතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සංශෝධන ඇත්නම් ඉදිරිපත් කර සභා සම්මත කර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදි.

ඒ අනුව 2025.08.28 වන දින මහා සභා රැස්වීම් වාර්තාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රාසීක් මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.කේ. ලලිත් පද්මසිරි විජයනන්ද මැතිතුමාගේ** යෝජනා ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමා විසින් කරන ලද නිවේදන,**

i. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්.ඉන්දික සම්පත් මැතිතුමා අද දින සභාව සඳහා සහභාගිවීමට නොවන බව නිවේදනය කිරිම**
ඒ අනුව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්.ඉන්දික සම්පත් මැතිතුමාගේ** නිවාඩුව ගරු සභාපති විසින් අනුමත කරන ලදි.

II. 2025/09/15 වන දින සිට 2025/09/21 වන දින දක්වා පැවති පලාත් පාලන සතියේ "පුනරුදයේ ඌව පුරවර" වැඩසටහන පිළිබඳ නිවේදනය

- **2025.09.15 - ජංගම සේවා දිනය**

  වැලිමඩ ප්‍රධාන කාර්යාලය,කැප්පෙටිපොල ,බොරලන්ද හා ඩයරබා යන උප කාර්යාලවල ජංගම සේවය පැවැත්විය.ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,ගමනා ගමන මණ්ඩලය,වන රක්ෂණ දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම උපදේශන කාර්යාල යන ආයතන සම්බන්ධ වූ අතර මෙම වැඩසටහන සඳහා 350 ක් පමණ ප්‍රජාව සහභාගි විය .

- **2025.09.16 - රුක් රෝපණ දිනය**

මෙම දිනයේ දි වක්කඩහින්න,ගෝනකුර,දික්කපිටිය හා බැලුන්ගල යන ජලපෝෂක ප්‍රදේශ තුළත්,කෝම්පෝස්ට් අංගනය හා උමා ඔය ඉවුර දෙපසත් කුඹුක් හා මී පැල 200 ක් පමණ සිටවනු ලැබිය. ඒ සඳහා ගරු ඩිලාන් මන්ත්‍රීතුමා ඇතුළු එම ප්‍රදේශවල ප්‍රදේශවාසීන්ගෙන් සහයෝගය ලැබුනු අතර බොරලන්ද,කැප්පෙටිපොල හා ඩයරබා යන පාසල්වල ළමුන් මැදිහත් වි පා ගමනක් පැවැත්විය.ඒ සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රීතුන්ලා ,තුමියන්ලා හා අදාල පාසල්වල විදුහල්පතිවරුන්හට ස්තුතිය පුදකර සිටිමි.

- **2025.09.17 සනිපාරක්ෂක දිනය**

මෙ දින දන්ත,අක්ෂි,රුධිර පීඩන,සිනි පරීක්ෂණ,ආයුර්වේද සායන යන සායනයන් වැලිමඩ පොල භූමියේ දි පැවැත්විය.එසේම බෝගහ කුඹුර උප කාර්යාලයේ ආයුර්වේද වෛද්‍ය සායනයක් ද පැවැත්විය. මේ සායන සඳහා 340 ක් පමණ පිරිසක් සම්බන්ධ වු අතර ගර්භනි මව්වරුන්හට රස වින්දන වැඩසටහක් අප සභා ගර්භයේ දි පවත්වනු ලැබිය. ඊට සම්බන්ධ වු සියලු මව්වරුන්හට පරිත්‍යාගශිලින්ගේ දායකත්වයෙන් පෝෂණ මල්ලක් ලබා දිමට හැකි වු අතර ඒ සඳහා දායකත්වය ලබාදුන් සියලු දෙනාට ස්තූතිය පුද කර සිටිනවා.

තවද හොඳ සෞඛ්‍ය පුරුදු පවත්වාගෙනයාම තුලින් අත්වන වාසි පිළිබද වීදී නාට්‍යක් වැලිමඩ මධ්‍ය විද්‍යාලීය දූවා දරුවන්ගේ සහභාගිත්වයෙන් වැලිමඩ බස් නැවතුම්පොලේ දි රඟ දක්වනු ලැබිය. ඒ සඳහා සහයෝගය ලබාදුන් වැලිමඩ මධ්‍ය විද්‍යාලීය විදුහල්පතිතුමන්හට ස්තූතිය පුද කර සිටින අතර මධ්‍යම පරිසර අධිකාරිය මඟින් වැලිමඩ නගරයේ ආපනශාලා පරික්ෂා කිරිමේ වැඩසටහනක් ද පැවැත්විය.

- **2025.09.18 අදායම් ප්‍රවර්ධන දිනය**

වැලිමඩ නගරයේ හා වරිපනම් ඒකක ක්‍රියාත්මක වන ප්‍රෙද්ශ තුළ වරිපනම් බදු අයකර ගැනිමේ විශාල ගැටවවක් පවතින බැවින්, එදින හිඟ ආදායම් වලට අදාල දඩ පොලිය ඉවත්කර ඊට අදාළ වරිපනම් ආදායම් එකතු කිරිම සිදු කරනු ලැබුවා.එසේම බෝගහකුඹුර නගරයේ ත්‍රි වීල් රථගාල් 03ක්ද,බොරලන්ද නගරයේ එක් ත්‍රි වීල් රථගාලක් ක්ද, නුගතලාව නගරයේ එක් ත්‍රී වීල් රථගාලක්ද වශයෙන් ත්‍රීවීල් රථගාල් 05ක් ලියාපදිංචි කිරිමට හැකි වු අතර මේ දින හිඟ ආදායම් රුපියල් 1,882,234.19 ක මුදලක් අයකර ගැනිමට හැකි විය.ඒ සඳහා සහය වු මාරසිංහ මහතා ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තුතිවන්තවනවා.

- **2025.09.19 පුස්තකාල ප්‍රවර්ධන දිනය**

මේදින ජංගම පුස්තකාලයක් පැවැත්විමටත්, වැලිමඩ ප්‍රෙද්ශයේ ගත් කතුවරුන් හඳුනා ගැනිමටත් හැකි විය.එසේම තෝරාගත් සුසාන භූමි කිහිපයක් ශුද්ධ පවිත්‍ර කටයුතු සිදු කල අතර සොහොන් පිට්ටනි 75-80ක් අතර ප්‍රමානයක් ශුද්ධ කර ගැනිමට හැකි විය.එසේම මේ දින ජංගම පුස්තකාල හරහා නොමිලේ සාමාජිකයින් බඳවා ගැනිමේ වැඩසටහනක්ද ක්‍රියාත්මක කරනු ලැබුනු අතර එහි දි 1235ක පුස්තකාල සමාජිකයින් බඳවා ගැනිමට හැකි විය.

- 2025.09.20 මහජන උපයෝගීතා සේවා දිනය

බොරගස් සිට රේන්දපොළ දක්වාද,බොරලන්ද වැලිමඩ මාර්ගයද පිරිසිදු කිරිම් කටයුතු කරනු ලැබිය.බොරලන්ද වැලිමඩ මාර්ගය ශුද්ධ පවිත්‍ර කිරිම සඳහා යුද හමුදා කදවුරේ සහය ලැබුණු අතර එම පිරිස සම්බන්ධ කල එම ආයතනයේ ප්‍රධානියාට ස්තූතිය පුද කර සිටිනවා.

- 2025.09.21 ක්‍රීඩා හා සමාප්ති දිනය

පුස්තකාල හා අධ්‍යාපන දිනයට සමගාමිව පාසල් චිත්‍ර තරඟයක් පැවැත්විය.එහි දි වයස් කාණ්ඩ 07ක් යටතේ ජයග්‍රහකයින් තෝරනු ලැබු අතර දරුවන් විසි එක් දෙනෙක් සදහා ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානය කරන ලදි..එසේම වැලිමඩ ප්‍රාෙද්ශිය සභාවේ සේවය කරන සෞඛ්‍ය කම්කරුවන් ඇගයිමේ වැඩසටහනක්ද දියත් කරනු ලැබු අතර එහි දි හොදම පැමිණිම සදහා සහතික පත්‍ර ලබා දෙන ලදි. තවද වැලිමඩ බල ප්‍රදේශයේ ගත් කතුවරුන් ඇගයිමද සිදු කරනු ලැබුවා.පසුව සුහද ක්‍රිකට් තරඟාවලක් සංවිධානය කර තිබු අතර ඒ සදහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය,ගමනා ගමන මණ්ඩලය.සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය,යන ආයතන සම්බන්ධ විය.ඒ තුළින් රාජ්‍ය ආයතන අතර පවතින සහයෝගිතාව වර්ධනය කර ගැනිමට අවකාශය ලැබිනි.

මෙලෙස පළාත් පාලන සතියේ වැඩසටහන් ඉතා සාර්ථකව ක්‍රියාත්මක කිරිමට අපට හැකි වු අතර දැනට ලැබෙන තොරතුරු අනුව පළාත් පාලන වැඩසටහන සාර්ථකව නිම කල ආයතනය අප ආයතනය බවට තොරතුරු ලැබි ඇත.

මෙම වැඩසටහන සම්බන්ධයෙන් සකසන ලද විනාඩි 10 ක පමණ කෙටි වීඩියෝ පටයක් සකසා ඇත.එය නරඹන ලෙස ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

III. පළාත් පාලන ආයතනයන්හි කාර්ය සාධන ඇගයීම් වැඩසටහන පිළිබඳ නිවේදනය

2024 වර්ෂයේ ජාතික මට්ටමේ විනිශ්චය සදහා ඌව පළාතේ ප්‍රාදේශිය සභා 05ක් තෝරා ගෙන ඇති අතර අප ප්‍රාදේශිය සභාවද ඒ සදහා සුදුසුකම් ලබා ඇත.විශේෂයෙන්ම මෙම කාලය තුළ දේශපාලන අධිකාරියක් නොමැතිව මෙවැනි ජයග්‍රහණයක් ලබා ගැනිමට කටයුතු කල සභාලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට මාගේ විශේෂ ස්තුතිය පුදකර සිටිනවා. ඉදිරියේ දි පැවැත්වෙන ජාතික මට්ටමේ විනිශ්චයේ දිද ජයග්‍රහණය ලබා ගැනිමට හැකිවනු ඇතැයි මා විශ්වාස කරනවා.

**3. ප්‍රාදේශීය සභාව අමතා එවන සන්දේශ/පැමිණිලි/පෙත්සම්/සන්නිවේදන ලිපි - නැත**

**4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.**

**5.යථා පරිදි කල් දි ඇති යෝජනා**

**ගරු සභාපතිතුමාගේ යෝජනා**

**යෝජනා අංක 01**

**<u>බොරලන්ද නගරයේ කඩ කාමරය ඉදි කර ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ආර්.එම්.ප්‍රේමසිරි රණසිංහ මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය</u>**

2025.09.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අංක 04 දරණ නිර්දේශය පරිදි_එම ඉඩම් කොටස මාර්ග රක්ෂිතයට හා සභාව සතු ඉඩම් කොටසක්ද එම ස්ථානයේ පවතින බැවින් හා ගොඩනැගිලි ඉදි කිරිමට නොහැකිවන ආකාරයේ වංගු සහිත ස්ථානයක් වන හෙයින් මෙය බාහිර පාර්ශවයක් වෙත බදු පදනමකින් ලබා නොදිමටත්, දැනට ඉදිකිරිම් කර ඇති දේශිය බොජුන්හල වෙත පැමිණෙන පාරිභෝගිකයින්ගේ රථ වාහන නවතා තැබිම සඳහා රථ ගාලක් ලෙස සංවර්ධනය කිරිමටත්,සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.එම්.රාසීක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.09.25 වන දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 02**

**<u>කැප්පෙටිපොල ,නුවරඑලිය පාර අංක 03 දරණ කඩය පැවරිම</u>**

2025.09.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අංක 05 දරණ නිර්දේශය පරිදි දැනට සභාව අනුමත කර ඇති ඥාති පැවරුම් ගාස්තුව වන රුපියල් 25,000.00 ක මුදල අයකර ගිවිසුමේ 7 වගන්තිය ප්‍රකාරව කැප්පෙටිපොල ,පාසල අසල ,එරබද්ද යන ලිපිනයෙහි පදිංචි දොඩම්පෙ ගමගේ මනෝජා සංජීවනි මිය (825962077 V ) හට මෙකි කඩ කාමරයේ බදු අයිතිය පවරා දිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව ගරු මන්ත්‍රී ආර්.එම්. චන්ද්‍රසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.09.25 වන දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 03**

**<u>කැප්පෙටිපොල ,නුවරඑළිය පාර අංක 07 දරණ කඩය පැවරීම</u>**

2025.09.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අංක 06 දරණ නිර්දේශය පරිදි මෙම කඩ පැවරීම ඥාති සම්බන්ධතාවයක් මත සිදු නොවන බැවින්, දැනට සභාව අනුමත කර ඇති පැවරුම් ගාස්තුව වන රුපියල් 250,000.00 ක මුදල අය කර ගිවිසුමේ 7 වගන්ති ප්‍රකාරව කැප්පෙටිපොල, එරබද්ද, කරගහ ඇල්ල, යන ලිපිනයෙහි පදිංචි පතිරන්හේලාගේ සුනන්ද කුමාර පතිරණ (791852129V) යන අයට මෙකී කඩ කාමරයේ බදු අයිතිය පවරා දිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව ගරු මන්ත්‍රී එනස්ට් ඩෙන්සිල් ස්ලේඩන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.09.25 වන දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 04**

**<u>වැලිමඩ වෙළඳ සංකීර්ණය අසල අළුතින් ඉදිකර ඇති මාළු කඩ කාමර 02 බදු දිම</u>**

2025.09.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අංක 08 දරණ නිර්දේශය පරිදි එක් කඩ කාමරයක් සඳහා අවම ලංසුව ලෙස රු.1,368,750.00ක මුදලත්,ලංසු කැඳවීමේ දි ආපසු ආපසු නොගෙවන ටෙන්ඩර් ඇප තැන්පත්තුව ලෙස පෙර කඩ කාමර සඳහා කැඳවා ඇති මුදල (රු.5,800.00) ක් ඒ ආකාරයෙන්ම ලබා ගැනිමටත්,ආපසු ගෙවන ටෙන්ඩර් ඇප තැන්පත්තුව ලෙස රු.10,000.00 මුදලත්, තිරණය කල අතර අනෙකුත් සභා දේපල ලංසු කැඳවන අවස්ථාවේදි මෙම කඩ කාමර 02ද පුවත් පත් දැන්වීම සඳහා ඇතුලත් කිරිමටත්, සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව ගරු මන්ත්‍රී ඊ. චන්දක වීරසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.09.25 වන දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 05**

**<u>2025 පලාත් පාලන වැඩසටහන යටතේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරිමට අදාල දළ වැය ඇස්තමේන්තුව</u>**

2025.09.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අංක 13 දරණ නිර්දේශය පරිදි 2025"පුනරුදයේ ඌව පුරවර " වැඩසටහනට සමගාමිව ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත වැඩසටහන් හා අදාල දළ වැය ඇස්තමේන්තුව වන රු.865,150.00ක මුදල සභා අරමුදලින් දැරිමට සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව ගරු උපසභාපති එම්.එල්.එම්. සෆ්වාන්

මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.09.25 වන දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 06**

**පළාත් පාලන සතිය නිමිත්තෙන් 2025.09.19 වන දින පුස්තකාල සමාජිකත්වය නොමිලේ ලබා දීම**

2025.09.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අංක 14 දරණ නිර්දේශය පරිදි 2025.09.19 වන දින පුස්තකාල සමාජිකත්වය ලබා ගැනිමට පැමිණෙන වැලිමඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පාඨකයින්හට නොමිලේ පුස්තකාල සමාජිකත්වය ලබාදිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.පී.ඥානපාල සේනාධීර

මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.09.25 වන දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 07**

**පළාත් පාලන සතියට අදාලව පැවැත්වෙන ආදායම් ප්‍රවර්ධන දිනයේදී වරිපනම් බදු සඳහා බිල්පොතෙහි ඇති අධි ගාස්තු ඉවත් කිරිම**

2025.09.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අංක 15 දරණ නිර්දේශය පරිදි 2025.09.18 වන දින ජංගම සේවාවේදි ගෙවනු ලබන වරිපනම් බදු සඳහා පමණක් සහනය ලබා දිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව ගරු මන්ත්‍රී ආර්.එම්. මහේෂ් කෝසල රාජකරුණා

මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. තාහිර් මහරූෆ් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව ප්‍රචාරණ කටයුතු සිදු කරනු ලැබුවත් වැලිමඩ නගරයේ සමහර වෙළඳ ප්‍රජාව දැනුවත්වෙලා නෑ.එම නිසා තව කෙටි කාල පරිච්ඡේදයක් ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මැතිතුමා,**

ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මෙම අධි ගාස්තුව ඉවත් කිරිම පිළිබඳව දැනුවත් කිරිම් කටයුතු සිදු කරනු ලැබුවේ පළාත් පාලන සතියට අදාළවයි. අධි ගාස්තු තියෙන සියලු නිවෙස් හා ව්‍යාපාරික ආයතන ලිපි මගින් දැනුවත් කිරිම් සිදු කරනු ලැබු අතර 2025.09.18 වන දින අදාළ ආයතනයට පැමිණ මෙම සේවය ලබාදෙන බවත් අප ප්‍රචාරණය කරනු ලැබුවා.මින් ඉදිරියට හිඟ වරිපනම් බද්ද නොමැතිව අය කිරිමට හැකියාවක් නැත.එසේ මින් ඉදිරියට හිඟ වරිපනම් ගාස්තුව නොමැතිව අය කිරිම් සිදු කරනවා නම් පලාත් පාලන අමාත්‍යවරයාගෙන් අවසරයක් ඇතුව කරන්න ඕනි.සාධාරණ හේතුවක් නොමැතිව පළාත් පාලන අමාත්‍යවරයාගෙන් අවසරය ලැබෙන බව අපට

විශ්වාස කරන්න බෑ.ඒවගේම ප්‍රදේශයේ ව්‍යාපාරික ප්‍රජාවට සහනයක් ලබා දීමේ අරමුණින් තමයි මෙය සිදු කරනු ලැබුවේ.වැලිමඩ ප්‍රදේශයේ ලිපි යොමු කල සෑම ස්ථානයකම නාම ලේඛණ අප සතුව තියෙනවා.කිසිම අයෙක් මඟ හැරි නෑ.මෙවැනි අවස්ථාවක් ලැබුණු විට අදාළ කටයුතු කර ගැනිමට ව්‍යාපාරික ප්‍රජාවද නම්‍යශිලි විය යුතුය.විශේෂයෙන් කැප්පෙටිපොල,බෝගහකුඹුර ප්‍රෙද්ශවල මෙම කටයුතු සිදු කරනු ලැබුවා.මේ නිසා ව්‍යාපාරිකයින් මේ පිළිඳව නොදැන ඉන්න විදිහක් නෑ.

එසේම ආදායම් එකතු කර ගැනිමේ දි සමහර කඩ වල හිමියන් කාර්ය මණ්ඩලයට බැණ වැදුණු අවස්ථාද තිබුණා.මෙවැනි අපහසුතා මැද තමයි අපි කටයුතු කරනු ලැබුවේ.එම නිසා ඉදිරියේ දි ආණ්ඩුව පැත්තෙන් සහනයක් ලබා දිමට යෝජනා කළහොත් මිසක මැදිහත් විම් කටයුතු කිරිමට අපට හැකියාවක් නොමැත.
මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.09.25 වන දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 08**

**2025 වර්ෂයට පුස්තකාල පොත් මිල දී ගැනිම**

2025.09.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අංක 22 දරණ නිර්දේශය පරිදි වැලිමඩ ප්‍රාදේශිය සභාවේ එක් පුස්තකාලයකට රුපියල් 200,000.00 බැගින් වන සේ රු.1,000,000.00 ක මුදල පොත් මිල දී ගැනිම සඳහා පුස්තකාල 05 වෙතට ලබා දිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.පී.ඥානපාල සේනාධීර

මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.09.25 වන දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 09.I**

**දිවිතොටවෙල කන්ද ග්‍රාමයේ බුදු මැදුර අසල සිට නගරය දක්වා දිවෙන අතුරු මාර්ගයේ පිලිසකර කර නොමැති කොටස කොන්ක්‍රීට් කිරිම**

2025.09.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අංක 24 දරණ නිර්දේශය පරිදි දිවිතොටවෙල කන්ද ග්‍රාමයේ බුදු මැදුර අසල සිට නගරය දක්වා දිවෙන අතුරු මාර්ගයේ පිලිසකර කර නොමැති කොටස කොන්ක්‍රීට් කිරිම සඳහා රුපියල් 1,999,000.00 ක ඇස්තමේන්තුව සභා අරමුදලින් දැරිමට සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.කේ. ලලිත් පද්මසිරි විජය නන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සිසිර දිලාන් ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ සමාජිකයෙක් ලෙස මා ඉන්නවා.නමුත් මෙවැනි මුදලක් නිර්දේශ කළේ නෑ. මේ පිළිබඳව පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමනි, මේ තියෙන්නේ මුදල් හා ප්‍රතිපත්ති කමිටුව සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාව.ඒවගේම මුදල් කමිටු වාර්තාවේ 24 වෙනි නිර්දේශය යටතේ ඉදිරිපත් කරන ලද දළ ඇස්තමේන්තු සියල්ල සඳහන් කරලා තියෙනවා.එදින සහභාගි වූ සියලු මන්ත්‍රීවරුන් දින මුද්‍රාව තුළ අත්සන් කරලත් තියෙනවා.ඔබතුමාට අවශ්‍ය නම් නැවත මෙය පරික්ෂා කර බලන්න පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. එම්.දයාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මෙහි මාර්ග සංවර්ධන යෝජනා 06 ක් තියෙනවා.මේ සඳහා කෝටියකට වඩා මුදලක් වැය වනවා.මේ නිසා මෙම සංවර්ධනයන් සිදු කරනු ලබන්නේ සභා අරමුදල් මගින්ද නැතිනම් මධ්‍යම රජයෙන් ලැබෙන අරමුදල්වලින්ද කියලා පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මැතිතුමා**

ගරු මන්ත්‍රිතුමනි, වැලිමඩ ප්‍රාදේශිය සභාවේ 2025 වර්ෂයට අදාළ අයවැය ලේඛයේ සංවර්ධන යෝජනා යටතේ ප්‍රාග්ධන යෝජනා ඉදිරිපත් කරලා තියෙනවා.එම අය වැය ලේඛණයේ ප්‍රාග්ධන සංවර්ධන යෝජනා 26 ක්ද,අනෙකුත් සංවර්ධන යෝජනා 10 ක්ද වශයෙන් සඳහන් කරලා තියෙනවා.මෙහි ප්‍රාග්ධන සංවර්ධන යෝජනා 26 යටතේ එන 06 වෙනි සංවර්ධන යෝජනාව ලෙස දිවිතොටවෙල කන්ද ග්‍රාමයේ බුදු මැදුර අසල සිට නගරය දක්වා දිවෙන අතුරු මාර්ගයේ පිලිසකර කර නොමැති කොටස කොන්ක්‍රීට් කිරිම දක්වා ඇත. සෑම අවුරුදකටම අදාළව අයවැය ලේඛණය සකස් කලාට පසුව අයවැය ලේඛණයේ ඇතුළත් සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරිම සඳහා සභා අරමුදලින් මුදල් ප්‍රතිපාදන වෙන් කරනවා.ඒ නිසා මේ සංවර්ධන ව්‍යාපෘති සඳහාද මුදල් ප්‍රතිපාදන වෙන් වෙලා තියෙනවා.ඒවගේම අයවැය ලේඛණයේ ඇති සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරිමට අපොහොසත් වුවහොත් විගණයට ලක්වෙන අතර තවත් අපහසුතාවලට මුහුණදිමට සිදුවේ.එබැවින් අයවැය ලේඛණයේ ඇති සංවර්ධන යෝජනා අනිවාර්යෙන්ම අපි ක්‍රියාත්මක කල යුතුය.ඒ අනුව මේවන විට 2025 අයවැය ලේඛණයේ ප්‍රාග්ධන සංවර්ධන යෝජනා 26 යටතේ සංවර්ධන ව්‍යාපෘති සැලකිය යුතු ප්‍රමාණයක් ක්‍රියාත්මක කරලා තියෙනවා.එසේ කිරිමට නොහැකි වූ යෝජනා සභාවට ඉදිරිපත් කර අදාළ අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කිරිම සඳහා තමයි සැලසුම් කලේ. ඉදිරියට වර්ෂා කාලය එළඹෙන නිසා මෙය කඩිනම් කල යුතුය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. තාහිර් මහරූෆ් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මමත් මුදල් කමිටුව සඳහා එදින සහභාගි වුනා.නමුත් මාගේ අත්සනත් මෙහි නැත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සිසිර දිලාන් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මෙම සංවර්ධන කටයුතු අඩාල කිරිමටවත්, ගමේ සංවර්ධනය කිරිමට විරුද්ධවවත් නොවෙයි මා මේ අදහස් කරන්නේ.එදින මුදල් කමිටුවෙහි මෙම යොජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් අත්සන් කරලා තිබුනට මා අත්සන් කරලා නෑ.එසේම 2025 වර්ෂයේ අයවැය ලේඛණයේ ඇති එම යෝජනා සම්බන්ධයෙන් මුදල් කමිටුවේදි යෝජනා එකින් එක පැහැදිලි කිරිමක් සිදු කලෙත් නැත.මම යෝජනාවන් සඳහා අත්සන් කරන විට එකින් එක කියවලා තමයි අත්සන් කරන්නේ.ඒ නිසා මෙවැනි යොජනාවක් ගෙන ආවේ නැති බව මාගේ අදහසයි.ගරු සභාපතිතුමනි,මේ සම්බන්දයෙන් කාරක සභා අවස්ථාවක් ගෙන හෝ කතා කල යුතුය.

අනතුරුව ගරු සභාපතිතුමන් විසින් මහා සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ගන්නා ලෙස ගරු මන්ත්‍රීවරුන්හට පවසා සිටින ලදි.

ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධයෙන් විවිධ මතවාදයන් පැන නැගුණු හෙයින් **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම් දයාරත්න මැතිතුමා** විසින් සභාව කාරක සභා අවස්ථාවක් ලෙස පත් කිරිම සුදුසු බවට යෝජනා කරන ලදි.එම යෝජනාව **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී තුවාන් කාසිම් මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.
ඒ අනුව ගරු සභාව කාරක සභා අවස්ථාවක් බවට පත්විය.

පසුව **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි නිලූකා කුසුම් කුමාරි මැතිනිය** විසින් කාරක සභා අවස්ථාව මහා සභා අවස්ථාව බවට පත් කිරිමට යෝජනා කරන ලදි. එම යෝජනාව **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.දයාරත්න මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි

අනතුරුව මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.09.25 වන දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 09 .II**

<u>**දිවිතොටවෙල කොස්ගහකුඹුර මාර්ගය සකස් කිරිම**</u>

2025.09.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අංක 24 දරණ නිර්දේශය පරිදි දිවිතොටවෙල කොස්ගහකුඹුර මාර්ගය සකස් කිරිම සඳහා රුපියල් 1,525,316.52 ක ඇස්තමේන්තුව සභා අරමුදලින් දැරිමට සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජේ.පී. චිත්‍රා ජයසිංහ පතිරණ මැතිණිය** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.09.25 වන දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 09.III**

<u>**දිවිතොටවෙල කුඹුරුයාය මාර්ගය සංවර්ධනය කිරිම**</u>

2025.09.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අංක 24 දරණ නිර්දේශය පරිදි දිවිතොටවෙල කුඹුරුයාය මාර්ගය සංවර්ධනය කිරිම සඳහා රුපියල් 1,035,669.40 ක ඇස්තෙමින්තුව සභා අරමුදලින් දැරිමට සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. ප්‍රේමරත්න මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.09.25 වන දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 09.IV**

**<u>දඹවින්න වත්ත හපුතලේ පාරේ නිමල් ලී මෝල අසලින් දිවෙන මාර්ගය සංවර්ධනය කිරිම</u>**

2025.09.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අංක 24 දරණ නිර්දේශය පරිදි දඹවින්න වත්ත හපුතලේ පාරේ නිමල් ලී මෝල අසලින් දිවෙන මාර්ගය සංවර්ධනය කිරිම සඳහා රුපියල් 1,755,000.00ක ඇස්තෙමේන්තුව සහා අරමුදලින් දැරිමට සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ටී.කේ. ලලිත් පද්මසිරි විජය නන්ද මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.09.25 වන දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 09.V</u>**

**<u>දඹවින්න සිට කැටකැල්ල මාර්ගය සංවර්ධනය කිරිම</u>**

2025.09.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අංක 24 දරණ නිර්දේශය පරිදි දඹවින්න සිට කැටකැල්ල මාර්ගය සංවර්ධනය කිරිම සඳහා රුපියල් 2, 000,000.00 ක ඇස්තමේන්තුව සහා අරමුදලින් දැරිමට සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු උපසභාපති එම්.එල්.එම්. සෆ්වාන් මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.09.25 වන දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 09.VI**

**<u>කළුබුලුලන්ද විහාරගොඩ මාර්ගය සංවර්ධනය කිරිම</u>**

2025.09.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අංක 24 දරණ නිර්දේශය පරිදි කළුබුලුලන්ද විහාරගොඩ මාර්ගය සංවර්ධනය කිරිම රුපියල් 1,261,035.42 ක ඇස්තමේන්තුව සහා අරමුදලින් දැරිමට සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එනස්ට් ඩෙන්සිල් ස්ලේඩන් මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.09.25 වන දින සභාවේදී ඒකමතිකව සහා සම්මත විය.

**යෝජනා අංක 10**

**<u>2025 සැප්තැම්බර් මස මන්ත්‍රී දීමනා ගෙවීම</u>**

වැලිමඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති,උප සභාපති හා ගරු මන්ත්‍රී තුමන්ලා ,තුමියන්ලාගේ 2025 සැප්තැම්බර් මස මන්ත්‍රී දීමනා වශයෙන් රු.675,000.00 මුදලක් ප්‍රතිපූර්ණයට යටත්ව සහා අරමුදලින් දැරීමට සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව ගරු උපසභාපති **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.වී.එන්.කුසුම් කුමාරි මැතිනිය** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.09.25 වන දින සභාවේදී ඒකමතිකව සහා සම්මත විය.

**යෝජනා අංක 11**

**<u>2025 සැප්තැම්බර් මස දෛනික වැටුප් ගෙවීම</u>**

වැලිමඩ ප්‍රාදේශීය සභාවේ දෛනික සේවයේ නිරත සේවක මහත්ම මහත්මීන් 36 දෙනෙක් සඳහා 2025 සැප්තැම්බර් මස දෛනික වැටුප් වශයෙන් රු. 2,220,992.50 ක මුදලක් ප්‍රතිපූර්ණයට යටත්ව සහා අරමුදලින් දැරීමට සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව ගරු උපසභාපති **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.දූෂාන්ත ඉන්දික රන්දෙණිය** මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.09.25 වන දින සභාවේදී ඒකමතිකව සහා සම්මත විය.

**යෝජනා 12**

**<u>හිඟ වරිපනම් බදු මුදල් කපා හැරීමට ලිපිය</u>**

2025.09.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ 20 දරණ නිර්දේශය පරිදි වැලිමඩ නගරයේ වරිපනම් සීමාවට අයත් A5 මාර්ගය සංවර්ධනය කිරිමේදී අත්පත් කරගත් දේපල හා නුවරඑළිය ඌව පරණගම මාර්ගය යා කරමින් ඉදි කරන ලද පාලම හේතුවෙන් ඉවත් වූ සහා දේපල සඳහා අය කර ගත යුතු හිඟ ශේෂ ලේඛණවලින් ඉවත් කිරිමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්ති ප්‍රාකාරව අය කරගත නොහැකි ආදායම් ලේඛන වලින් අතහැර ගැනිම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.ධනුෂ්ක තිලකසිරි මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.09.25 වන දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා 13**

ඒ.එම්.හුසෙයින්,ප්‍රාදේශිය සභා මන්ත්‍රී (NPP),පුරන් කුඹුර,අළුගොල්ල,බෝගහකුඹුර,2025.09.16.ගරු ප්‍රාදේශිය සභා ලේකම්තුමා මගින්,ප්‍රාදේශිය සභා සභාපතිතුමා,ප්‍රාදේශිය සභාව,වැලිමඩ.ගරු සභාපතිතුමනි,ඉදිරි මාසික සභාවාරය සඳහා ඉදිරිපත් කරන යෝජනාවයි.

අප ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ දීර්ඝ කාලයක සිට සිංහල,මුස්ලිම්,ද්‍රවිඩ ප්‍රජාව පරිහරණය කරන්නා වූ සුසාන භූමි මේවන තෙක් විධිමත් පාලනයකින් තොරව අවිධිමත් පරිහරණයට ලක්ව ඇත.මේ නිසාම අප ගම්වාසින් ජනතාව විවිධ අපහසුතාවලට පත්වන බෝහෝ අවස්ථා ඇත.එම නිසා අප ප්‍රාදේශීය සභාව ලෙස ප්‍රදේශයේ මේ වන විට ජනතාව පරිහරණය කරන්නා වූ සුසාන භූමි විධිමත්ව පරිහරණයට සුදුසු ලෙස නීත්‍යානුකුලභාවය ලබා ගැනිම සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරමි.

අප ප්‍රාදේශිය සභාව නියෝජනය කරන්නා වූ සියලුම සභා නියෝජිතයින්ගේ මුලිකත්වය ඇතිව ඔවුන්ගේ ග්‍රාම නිලධාරි වසම නියෝජනය කරන්නා වූ සියලු රාජ්‍ය නිලධාරින් හා වසමේ ප්‍රජා දායකත්වයද ඇතිව කමිටුවක් ගොඩනඟා එහි මුලිකත්වයෙන් අප සභා බල ප්‍රදේශයේ සුසාන භූමි වල ඇති ප්‍රායෝගික ගැටළු හඳුනාගෙන අප සභාවේ මැදිහත්වීමෙන් එම ගැටළු සඳහා විධිමත් නීත්‍යානුකුල විසඳුමක් ලබා දීම සඳහා මැදිහත් වියයුතු බවත්,මෙහි දි වතුකර දමිල ප්‍රජාවගේ මෙම ගැටළුව විශේෂයක් වි ඇති බැවින්,ඒ සඳහාද විශේෂ අවධානයකින් මැදිහත්වීමක් ලබා දිය යුතු බවටත්, මෙම ගරු සභාවට මා යෝජනා කර සිටිමි. මෙයට, ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඒ.එම්.හුසේන් මන්ත්‍රී.

**ඒ.එම්.හුසේන් මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව මන්ත්‍රී ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්. ජබාර් තුවාන්කාසිම් මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.09.25 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**06.කාරක සභා වාර්තා සලකා බැලිම.**

ගරු ප්‍රාදේශිය සභා සභාපති ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා විසින් සංශෝධන ඇත්නම් ඉදිරිපත් කරන ලෙස පවසා සිටින ලදි.

ඒ අනුව,

I. 2025.09.03 වන දින නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව
II. 2025.09.04 වන දින කාර්මික හා සේවා කමිටු වාර්තාව
III. 2025.09.08 වන දින පරිසර හා සේවා කමිටු වාර්තාව
IV. 2025.09.09 වන දින මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව

ඉහත සඳහන් කාරක සභා වාර්තා සලකා බලන ලද අතර එකී නිර්දේශයන් ක්‍රියාක්මක කිරීමට සභාව අනුමත කරන ලදි

**07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා හා සභාගත කළ යුතු වෙනත් ලේඛණ**

ලැබීම් හා වියදම් පිළිබඳ 2025 අගෝස්තු මස මාසික ප්‍රකාශන එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව ගරු සභාව විසින් පිළිගන්නා ලදි.

**08. ගරු මන්ත්‍රිවරුන්ගේ අදහස් හා යෝජනා**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමනි,කොට්ඨාශ මට්ටමින් එක් සංවර්ධන යෝජනාවක් ලබාදෙන ලෙස පසුගිය සභාවේ දි ඔබතුමා නිවේදනය කරනු ලැබුවා.එසේම පසුගිය පළාත් පාලන මැතිවරණයේ දි කොට්ඨාශ මට්ටමින් ජයග්‍රහණය කල මන්ත්‍රිවරු වගේම ලැයිස්තු මන්තීවරු 19 ක්ද මේ සභාවට තේරි පත්වුණා.එබැවිත් මන්ත්‍රිවරුන්ගේ ගරුත්වය
අපි මන්ත්‍රිවරයෙක් ලෙස තේරි පත්වුවාට පසුව ගමේ ජනතාව බලාපොරත්තු වන්නේ ගමේ තියෙන සංවර්ධන අඩුපාඩු අප හරහා සභාවට ඉදිරිපත් කර අදාල මැදිහත්වීම් කර ගැනිමටයි. නමුත් මේවන විට සභාවට අපි තේරි පත් වි මාස කිහිපයක් ගත වුවත් කොට්ඨාශ මන්ත්‍රිවරයෙක් ලෙසවත්,ලැයිස්තු මන්ත්‍රීවරයෙක් ලෙසවත් ජනතාවට සේවය කරන්න ඔබතුමා අවස්ථාවක් ලබා දුන්නේ නෑ.මේ සම්බන්ධයෙන් අප කණගාටුවෙනවා.2025 සංවර්ධන යෝජනා අද දිනත් සම්මත කරගනු ලැබුවා. එවගේම ඔබතුමා සභාවට අවාට පසුව කොට්ඨාශ තුළ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කලා.නමුත් ඒ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන විට අදාල කොට්ඨාශයේ මන්ත්‍රිවරුන්වත් දැනුවත් කරලා නෑ.එසේම ඔබතුමා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව කටයුතු කරයි කියලා අප තුළ ලොකු විශ්වාසයක් තිබෙන අතරම ගරු මන්ත්‍රිවරුන්ට ගරුත්වයක් ලබා දෙමින් කටයුතු කරන්න ඕනි.
එසේම පසුගිය සභාවන්හි සිටි සියලු සභාපතිවරුන් යියපලු මන්ත්‍රිවරුන්හට ගරුත්වයක් ලබාදෙමින් කොට්ඨාශ මට්ටමින් මන්ත්‍රිවරුන්හට ප්‍රතිපාදන වෙන්කර දුන්නා.එය මේ වර්සයේදිත් එලෙස සිදුවේවි කියා අප බලාපොරොත්තුවනවා.අයවැය ලේඛණයෙන් සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබුනත්,පරිපුරක ඇස්තමේන්තුවක් දාලා හෝ ගමට සේවයක් කිරිමට අවස්ථාව ලබා දෙන්න ඕන.



**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් හලීම් මොහොමඩ් ෆායිස් සයිබු මැතිතුමා**

ගරු සභාපතිතුමනි,දෙමළ මාධ්‍යයන් ලබාදුන් මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ තාහීර් මහාරුෆ් මන්ත්‍රීතුමාගේ නම පැමිණීම යටතේ හා නොපැමිණීම යටතේද සටහන් වී ඇත.එසේම මුදල් කමිටු වාර්තාවේ දිනය 2025.09.03 වන දින ලෙස සටහන් කර ඇත.මේ නිසා එය සංශෝධන ලෙස සටහන් කර ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. තාහිර් මහරුෆ් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, අපට ලබා දී ඇති දෙමළ මාධ්‍ය යෝජනාවන්හි යෝජනා අංක 09. IV යටතේ මුදල රුපියල් 1,7550,000.00ක ලෙස සටහන් වී ඇත.මෙය 1,755,000.00ක ලෙස නිවැරදි විය යුතුය.

එසේම ගිය සභාවාරයේදි වැලිමඩ නගරයේ වාහන තදබදය පිළිබඳ කතා කලත්,එයට මේ වනතුරු විසඳුම් ලැබිලා නෑ.මෙහි දි ත්‍රී රෝද රථ තදබදය අවම කිරීම සඳහා ත්‍රී රෝද රථ නතර කරන ප්‍රමාණය දැක්වෙන දැක්වෙන දැන්වීම් පුවරු සවි කිරිමට හා ත්‍රී රෝද රථ ඉදිරියට මුහුණලා ගාල් කරන ලෙස ඉල්ලීම් කලත්,තවමත් එය සිදු වී නොමැත. එසේම මෝටර් බයිසිකල් ගාල් කර තැබිම රාත්‍රී 8.000 පමණ වනතුරු සිදු වන බැවින්,ඒ පිළිබඳවත් අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

තවද, වැලිමඩ නගරයේ වාහන තදබදය අඩු කිරිමට මඟි පාලම් ඉදිකිරිම සම්බන්ධයෙන් යෝජනා ඉදිරියේ දි ගෙන ඒමට මා බලාපොරොත්තු වෙනවා.එසේම වැලිමඩ නගරයේ අනවසර ඉදි කිරිම් කටයුතු සිදුවන බව පෙනි යනවා. මේ පිලිබඳව ඔබතුමාගේ අවධානය යොමු නොකිරිම පිළිබදව ගැටළුවකි. එසේම ආයුර්වේද ගැටළුව සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරිමට ඉදිරියේ දි යෝජනා ගෙනඒමට මා බලාපොරෝත්තුවනවා. එසේම සංවර්ධන යෝජනා සඳහා සෑම මන්ත්‍රීවරයෙකුටම ප්‍රතිපාදන ලබාදෙන ලෙස මා ඉල්ලා සිටින අතර කොට්ඨාශවල සංවර්ධන කටයුතු සිදු කිරිමේදි අදාළ කොට්ඨාශ මන්ත්‍රිවරුන් දැනුවත් කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් ප්‍රේමලාල් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,පළාත් පාලන සතියට අපට සහභාගිවිමට නොහැකි වුවත්,සභාපතිතුමා ඇතුළු මන්ත්‍රිවරු කිහිප දෙනෙක්ද ,ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයද සහභාගි වී එම වැඩසටහන් ආදර්ශමත් ලෙස ඉදිරිපත් කර තිබුනා.ඒ සඳහා අපගේ ස්තුතිය මේ අවස්ථාවේ දි පුද කර සිටිනවා.එසේම පසුගිය සභාවාරයේ දි මා විසින් යෝජනාවලියක් ඉදිරිපත් කරනු ලැබූ අතර එහි පොළ භූමියේ වැට සකස් කිරිම් කටයුතු මේවන විට සිදු කල ඇති අතරම අනෙක් යෝජනා සම්බන්ධයෙන් ද අවධාවනය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.කැලි කසළ එකතු කිරිම සඳහා ට්‍රැක්ටර් රථය වෙනුවට ලොකු ලොරිය ඒ සඳහා යොදා ගැනිම හේතුවෙන් මාර්ගය අවහිර වන බැවින් ඒ පිලිබඳව අවධානය යොමු කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.
තවද පදික කඩ ගිවිසුම් අත්සන් කිරිම දි පසු පැවරුම් ගාස්තු ලෙස මේ වර්ෂය සඳහා රුපියල් 300,000.00 ක් ද,ලබන වර්ෂය සඳහා රුපියල් 600,000.00 ක් ද අය කරන බව කාර්මික නිලධාරිතුමිය විසින් පදික කඩ වෙළඳුන් දැනුවත් කර තිබුණා .මේ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.එසේම ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන් හා කාර්ය මණ්ඩලය නිලධාරින් අන්‍යෝන්‍ය වශයෙන් දැනුවත් කිරිමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලෙසද මා ඉල්ලා සිටිනවා.තවද බස් නැවතුම් පොළෙහි උඩ තට්ටුවෙහි සෙනසුරාදා .ඉරිදා දිනවල ළමුන් මත්ද්‍රව්‍ය

හා විවිධ අපචාර කටයුතු වලට යොමු වන බව පෙනේ.මේ නිසා  එම ස්ථාන අදායම් උත්පාදන ස්ථාන ලෙස වැඩි දියුණු කිරිමේ  වැඩ පිළිවෙලක් සකස් කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  එම්.එම්.දයාරත්න   මැතිතුමා**

ගරු සභාපතිතුමනි,බොරලන්ද හෙල බෝජුන්හල විවෘත කිරිම සම්බන්ධයෙන් සභාපතිතුමා, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට මාගේ ස්තුතිය පුද කර සිටිනවා.මේ පිලිබඳව ප්‍රචාරණ කටයුතු අඩුපාඩු පැවතිම හේතුවෙන් මිනිසුන් දැනුවත් වි නොමැති බව එහි සේවයේ නියුතු අයගෙන් මට දැන ගන්නට ලැබුණා.මේ නිසා මේ පිලිබඳව අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.එවගේම කොට්ඨාශ 24 සඳහා සංවර්ධන යෝජනා  ලබාගැනිම පිළිබඳව මා අගය කරන අතර මාගේ කොට්ඨාශය නියෝජනය කරන්නේ මා පමණක් නිසා මට මෙහි ගැටළුවක් නැත.නමුත් එක කොට්ඨාශයට මන්ත්‍රිවරු කිහිපදෙනෙක් සිටින විට එය ගැටළුවකි.එසේම ලැයිස්තු මන්ත්‍රිවරු 19 ක් සිටින නිසා ඔවුන්ට මෙය අසාධාරණයකි.ලැයිස්තුගත මන්ත්‍රිවරයාට අභිමානයෙන් යුතුව සිටිමට නම් ඔවුන් වැඩ කල යුතුය.ඒ නිසා සංවර්ධන කටයුතු සඳහා ඒ මන්ත්‍රිවරුන්හට ප්‍රතිපාදන වෙන් කිරිම සුදුසු යැයි මා ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජබාර් තුවාන්කාසීම්   මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මුලින්ම තංගල්ල නගර සභාවේ හදිසි අනතුර හේතුවෙන් මියගිය සියලු දෙනා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කර සිටිනවා. එසේම  හද්දාවල මාර්ගය ප්‍රෙදේශවාසීන් විසින්  කිහිප සැරයක් ශුද්ධ පවිත්‍ර කලත් දැන් එය මිනිසුන්ගෙන් කර ගැනිමට නොහැකි තත්වයත්කට පත්වෙලා තියෙනවා. එවගේම මෙම ගම තුල පමණක් නොව අනෙකුත් ගම්වලද මෙම ගැටළුව පවතිනවා.එබැවින් මේ පිළබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.ප්‍රාදේශිය සභා පනතේ 9.18 වගන්තිය යටතේ දහම් පාසල් කටයුතු පිළිබඳව හා පෙර පාසල් සම්බන්දයෙන්  ප්‍රාදේශිය සභාවට බලයක් හිමිවන සඳහන්වනවා.මේ හෙයින් මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමුකරන ලෙස මා ඉල්ලා සිටිනවා.

තවද මන්ත්‍රිවරුන් කිහිප දෙනෙක්ම සංවර්ධන යෝජනා ලබාදීම සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරනු ලැබුවා.සංවර්ධනය සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුව විසින් හොද වැඩපිළිවෙලක් ගෙනයනු ලබන බව පෙනි යන අතර වැලිමඩ ප්‍රාදේශිය සභාවද එම වැඩපිළිවෙල ඒ ආකාරයෙන්ම ගෙන යයි කියා මා විශ්වාස කරනවා.ගමට සේවයක් කිරිම සඳහා එක් එක් මන්තී්වරුන් හට එක් සංවර්ධන යෝජනාව බැගින් ඉදිරිපත් කිරිමට අවස්ථාව ලබා දෙන ලෙසත් මා ඉල්ලා සිටින අතර මන්ත්‍රීවරුන්ගේ හැඳුනුම්පත් ලබාදිමේ කටයුතු කඩිනම් කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  එම්.එච්. අබ්දුල් හාසිම් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,ගුරුතලාව කොට්ඨාශයට හා සමාජයට මහත් සේවයක් කල ඒ.ආර්.එම්.රසාත් මැතිතුමාගේ අභාවය පිළිබඳව මාගේ ශෝකය මේ අවස්ථාවේ දි ප්‍රකාශ කර සිටිනවා.එසේම මෙම සභාවේ දි  මුල් වතාවට විපක්ෂ මන්ත්‍රිවරුන්හට ප්‍රතිපාදන වෙන් නොකිරිම සම්බන්ධව කණගාටුව ප්‍රකාශ කර සිටින අතර ගමට තේරි පත්ව මන්ත්‍රිවරයා සුළුවෙන් හෝ ගමට සේවයක් කරනු ඇතැයි ගම් වැසියන් බලාපොරෝත්තුවනවා.එබැවින් සෑම මන්ත්‍රිවරයෙකුටම ගමට සේවය කිරිම සඳහා  ප්‍රතිපාදන ලබාදෙන ලෙස මා  ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිත්ති උසෙයිමා මැතිනිය**

ගරු සභාපතිතුමනි,හාසිම් මැතිතුමා ප්‍රකාශ කල පරිදි ඒ.ආර්.එම් රසාත් මැතිතුමාගේ අභාවය පිළිබඳව මාගේද ශෝකය ප්‍රකාශ කර සිටිනවා.පළාත් පාලන සතිය සාර්ථකව නිම කල බව අපට දක්නට ලැබුනා.මේ සඳහා සහය දැක් වූ සියලුදෙනාට මාගේ ස්තුතිය පුද කර සිටිනවා.එසේම ගුරුතලාව වසමේ මන්ත්‍රීවරුන් පස් දෙනෙක් සිටින බැවින්,එක් එක් මන්ත්‍රීවරයාට ප්‍රතිපාදන ලබා දෙන්නේ නම් ගමට සේවයක් කිරිමට හැකියාව ලැබෙනවා.එසේම වැලිමඩ ප්‍රෙද්ශයේ කාන්තාවන් සඳහා ආර්ථික අභිවෘද්ධිය නඟා සිටුවිම සඳහා කිසියම් වැඩ පිලිවෙලක් සකස් කිරිම කෙරෙහි ඔබතුමාගේ අවදානය යොමු කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.මුත්තු කුමාර් මැතිතුමා**

**ගරු සභාපතිතුමනි,වැලිමඩ හින්දු පාසල අසල පිහිටි පාලම අනාරක්ෂික බැවින් එය සකස් කර දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටි.එම්.චන්ද්‍රිකා තෙන්නකොන් මැතිණිය**

**ගරු සභාපතිතුමනි,**පළාත් පාලන සතිය පිළිබඳ වැඩසටහනට අපිට සහභාගිවීමට නොහැකි වුවත් ඒය සාර්ථකව සිදු කර තිබුණා.ඊට සම්බන්ධ වුණු සියලු දෙනාට ස්තූතිය පුදකර සිටිනවා.හිටපු ප්‍රාදේශි සභා මන්ත්‍රී ඒ.ආර්.එම්.රසාත් මැතිතුමාගේ අභාවය වෙනුවෙන් මා මේ අවස්ථාවේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා.ඒම මන්ත්‍රිතුමා හා මා පසුගිය සභාවේ දි සහයෝගයෙන් කටයුතු කරනු ලැබුවා.ගරු සභාපතිතුමා විසින් පසුගිය සභා වාරෙය්දී එක් කොට්ඨාශයකින් එක් සංවර්ධන යෝජනාව බැගින් ඉදිරිපත් කරන ලෙස නිවේදනය කරනු ලැබුවා.නමුත් අප කොට්ඨාශය නියෝජනය කරමින් මන්ත්‍රිවරුන් තුන් දෙනෙක් සිටිනවා.අපි තුන්දෙනා එකතු වී එක් සංවර්ධන යෝජනාවක් සැදීමට කතිකා කරගත්තද, එය සිදු කිරීමට නොහැකි වුණු බැවින් ,වෙන් වෙන් වශෙයන් සංවර්ධන යෝජනා තුනක් ලබා දීමට සිදු විය. අප සියලු දෙනාම එක හා සමාන මන්ත්‍රිවරුන් වන බැවින් එක් එක් මන්ත්‍රිවරයාට වෙන් වෙන් වශයෙන් ප්‍රතිපාදන ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස් .දනිෂා මැතිනිය**

**ගරු සභාපතිතුමනි,ඔහිය රෝහල සඳහා වෛද්‍යවරයෙක් ලබාදිම සම්බන්ධයෙන් මා ස්තූතිවන්ත වන අතර ඔහිය ප්‍රෙද්ශයේ අතුරු මාර්ග පිළිසකර කර නොමැති අතර එම මාර්ග පිළිසකර කර දෙන ලෙස හා ඔහිය ක්‍රීඩා පිට්ටනිය සකස් කර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.**



**ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ප්‍රියන්ත චාමින්ද මැතිතුමා**

ගරු සභාපතිතුමනි,පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු 44 දෙනෙක් මේ සභාව නියෝජනය කරනු ලබනවා. අපි පිටත දේශපාලනය සිදු කළත් සභාවේ මන්ත්‍රීවරයෙක් ලෙස පත්වී පැමිණි පසු සභාව ඇතුළේ අපි දේශපාලනය සිදු කරන්නේ නැහැ.ඔබතුමා මීට පෙර සභාවේදි අප සමග මන්ත්‍රීවරයෙක් ලෙස අපි සමග සහයෝගයෙන් වැඩ කළා.එසේම ඔබතුමන්ලාට මධ්‍යම රජයෙන් සංවර්ධන යෝජනා කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් වෙන බැවින් ගමට විශාල සේවයක් කිරිමට අවස්ථාව තිබෙනවා.එසේම ඔබතුමා කැමති නම් අපිට ගමට සේවය කිරිමට ප්‍රතිපාදන වෙන් කර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.එසේම සභාව තුළ තින්දු තීරණ ගන්නා විට ඉදිරි අනාගතය ගැනත් සිතා තින්දු තීරණ ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

තවද පසුගිය සභාවේදි මා මැදිහත් වි මිරහවත්ත ප්‍රෙද්ශයටට ජල ව්‍යාපෘතියක් ගෙන එනු ලැබුවා.එසේම අල ගොවියා පිළිබඳව මෙන්ම එළවළු ගොවියාගේ ආර්ථිකය නගා සිටුවිම සඳහා වැඩපිළිවෙලක් සකස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. තවද සභාව ආරම්භ කිරිමට මත්තෙන් ආගම සිහි කිරිම,ජාතික ගීය ගායනා කිරිම වැනි කරුණු කෙරෙහිද ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එච්.එම්.ශාන්තා ප්‍රසාදි දේශානි මැතිණිය

ගරු සභාපතිතුමනි,පළාත් පාලන සතිය සාර්ථකව නිම කිරිම සම්බන්ධව මාගේ ස්තුතිය පුද කර සිටින අතර ප්‍රියන්ත මැතිතුමා සඳහන් කල පරිදි සභාව ආරම්භ කිරිමට ප්‍රථම ආගම සිහි කිරිමේ කටයුතු සිදු කරනවා නම් හොඳයි කියා මමත් සිතනවා.ඒවගේම දහම් පාසල සභා විෂය පථයට අදාළ නම් දහම් පාසල් පුස්තකාල නැංවිම සඳහා ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.එසේම මන්ත්‍රිවරු බෝහෝ දෙනෙක් පැවසු පරිදි මන්ත්‍රි ප්‍රතිපාදන එක් එක් මන්ත්‍රිවරයාට ලබා දෙන්නේ නම් ගම වෙනුවෙන් යම් සේවාවක් කිරිමට හැකියාව ලැබෙන අතර ගමේ සමිති සමාගම් සඳහා අවශ්‍ය උපකරණ කට්ටලයක් හෝ ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩබ්.එම්. කුසුමාවතී මැතිණිය

ගරු සභාපතිතුමනි,පාළුගම ඇල්ල,දිමුතුගම.පුරන්වෙල යන කොට්ඨාශ ේතුනම මා නියෝජනය කරනු ලබනවා.සභාපතිතුමා ස

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. පත්මිණි දිසානායක මැතිණිය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම් සිසිර දිලාන් ජයතිලක මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වසන්ත කුමාරන් මැතිතුමා

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර දිසානායක මැතිතුමා**

ගරු සභාපති ඩී.ඒම්.අජිත් කුමාර මැතිතුමා,

ෆායිස් සයිබු මන්ත්‍රීතුමා අදහස් දැක්වීමේ දෙමළ පරිවර්තනයේ අඩුපාඩු සම්බන්ධව අදහස් ඉදිරිපත් කළා. ඔබතුමාට සිදුවූ අපහසුතාවය පිළිබඳව මාගේ කණගාටුව ප්‍රකාශ කර සිටිනවා.ඒ වගේම මින් ඉදිරියට මේ සම්බන්ධව මනා අවධානයක් යොමු කර ඒ සම්බන්ධව අදාළ මැදිහත් වීම සිදුකරනවා..

ඒ වගේම ප්‍රභාත් මන්ත්‍රීතුමාගේ පැත්තෙන් අදහස් ගණනාවක් මතුවුණා.ඒහිදී මන්ත්‍රීවරුන්ට අවස්ථාව ලබා නොදුන්නා වගේ අදහසක් මතු වුණා. මන්ත්‍රීවරුන්ට සෑම කටයුත්තක් තුළදීම එම අවස්ථාව දීලා

තියෙනවා.මන්ත්‍රීවරුන් කැඳවලා පළාත් පාලන සතිය තුළ කළයුතු වැඩසටහන සාකච්ඡා කරගන්න ගිය සභාවේදී 2025.09.09 දිනය වෙන් කර ගත් නමුත් දිනට සහභාගි වූයේ මන්ත්‍රීවරියන් දෙදෙනකු පමණයි.ඒ සම අවස්ථාව හදන්න අදාළ මැදිහත් වීම සිදු කරගන්නඑම වැඩ සටහන්වලට සම්බපන්ධ වීම තියෙන්නෙ ගරු දිලාන් මන්ත්‍රීතුමා නරක පූර්වා දර්ශයක් . මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය කෙලෙසන්න අපේ පැත්තෙන්නිසිදු සිදුවීමක් , මැදිහත්වීමක් වෙලා නැහැගප්‍රභාත් මන්ත්‍රීතුමනි ීතයානුකූල නොවන කිසිවක් සිදු නොවන බව අපි වගකීමෙන් කියනවා. සභා රීතිවලට අනුව කටයුතු සිදු විය යුතුයි.වැලිමඩ ප්‍රාදේශීය සභාව ගොඩ නගන්නනගනවානම් සියලු රාජ්‍ය ආයතනවල සහයෝගිතාවය ලබා ගැනීමේ අරමුණින් තමයි පළාත් පාලන සතිය නිර්මාණය කළේ.නමුත් කණගාටුව පළාත් පාලන මන්ත්‍රීතුමන්ලා ,තුමියන්ලාගේ මැදිහත්වීම ඉතාම අවමයි.

ගරු ප්‍රභාත් මන්ත්‍රීතුමා කම්ටු දීමනාව හා දුරකථන දීමනාව ලබා ගැනීම පිළිබඳ කතා කළා.මන්ත්‍රීතුමනි, සභා යෝජනාවක් ලෙස ඉදිරිපත් කර එය සම්මත වූ පසු මෙම දීමනාව ගෙවිය හැකිය.

තවද මහාරුෆ් මන්ත්‍රීතුමා පවසා සිටි සියලු කරුණු සත්‍යයි.ත්‍රීවිල් රථ ගාල් කිරීමට ස්ථානයක් නොමැති බැවින් ඒ සඳහා ස්ථානයක් වෙන් කර ගැනීමට අවශ්‍යය. මේ නිසා තව මාස තුන හතරක් මේ පීඩාව දරා ගැනීමට සිදු වේ.එසේම වැලිමඩ නගරයේ අනවසර ඉදිකිරීම් ඉදිරියේදි කිසිම ආකාරයකින් සිදු කිරීමට ඉඩ ලබා දෙන්නේ නැහැ.ඉදිකර ඇති අනවසර සියලු ඉදිකිරීම් ඒකවරම ඉවත් කිරීමට නොහැකි බැවින් ඊට අදාළ මූලික පියවරේ කටයුතු මේවන විට සිදු කරමින් පවතිනවා.

අජිත් මන්ත්‍රීතුමනි,ඔබතුමාගේ ප්‍රශ්නය හා යෝජනා ඊළඟ සභා වාරය පැවැත්වීමට දින 07 කට පෙර ලේකම්තුමාට භාර දිමට අවශ්‍ය කටයුතු කරන්න.කසල එකතු කිරීමේ රථය සම්බන්ධව කිහිප දෙනෙක්මකථා කළා.ඊට අදාළ මැදිහත් වීම සිදු කරනවා.ඒවගේම පදික කඩ පිළිබඳව කථා කළා.තාවකාලික වෙළඳුන් ඉවත් කිරීමට සභාව විසින් මැදිහත් වීම් සිදු කරනු ලබනු අතර කාර්ය මණ්ඩලය හා මන්ත්‍රී මණ්ඩලය හඳුනා ගැනීමේ වැඩ සටහනක් ඉදිරියේදි ක්‍රියාත්මක කිරිමට කටයුතු කරන අතර බස් නැවතුම්පොලෙහි උඩ තට්ටුවෙහි සිදුවන අක්‍රමික කටයුතු සම්බන්ධයෙන් ගමනා ගමන මණ්ඩලෙය් උඩ මහළේ සිදු වන අක්‍රමික කටයුතු සම්බන්ධයෙන් ඉදිරි ප්‍රාෙද්ශිය සම්බන්දීකරණ කමිටුවේදීදෙ සාකච්ඡා කිරිමට අපේක්ෂිතය.

එමෙන්ම තුවාන් මන්ත්‍රීතුමා හද්දාවල ගැටළුව සම්බන්ධව කථා කළා.මෙම ගැටළුව දීර්ඝ කාලයක් මුතිස්සේ පැවත එන්නක් වන අතර ප්‍රාෙද්ශිය සභාව ලෙස ඒ සඳහා අදාළ මැදිහත්වීම සිදු කරනු ලබනවා.තවද මන්ත්‍රීවරුන්ට හැඳුනුම්පත ලබා ගැනීම පිළිබඳ කථා කළා.ඊට අවශ්‍ය කටයුතු සකස් කර ඉදිරියේදි ඔබතුමන්ලාහට ඡායාරූප ලබා ගැනිමට දිනයක් දැනුම් දිමට කටයුතු කරනවා.

එසේම සිත්ති උසෙයිමා මන්ත්‍රීතුමිය හා මුත්තුකුමාර් මන්ත්‍රීතුමා විසින්ද අදහස් ප්‍රකාශ කරනු ලැබුවා.චන්ද්‍රකා තෙන්නකෝන් මන්ත්‍රීතුමිය බොරලන්ද හෙල බොජුන්හල විවෘත කිරීමට ආරධනා නොකිරීම පිළිබඳව කථා කළා.මන්ත්‍රීතුමියනි,මේ සම්බන්ධව කමිටුවක් පත්කර කමිටුව හරහා සියලු සංවිධාන කටයුතු සිදු වූ බැවින් මේ දේ සිදු වන්නට ඇති.ඉදිරියේදී මෙවන් අඩුපාඩු නොවන්නට කටයුතු සිදු කරනවා .ඒ සම්බන්ධව අපගේ කණගාටුව ප්‍රකාශ කරනවා.

ගරු දනීෂා මන්ත්‍රීතුමියද අදහස් දැක්වූවා. ගරු ප්‍රියන්ත මන්ත්‍රීතුමා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මුදල් වෙන් නොකරනවා බව පවසා සිටියා.වැලිමඩ ප්‍රාදේශීය සභාව නියෝජනය කරන සියලු මන්ත්‍රීවරුන්හට ඒක හා සමාන වරප්‍රසාද ලබා දෙනවා. ඔබට ඒ වගේ දෙයක් දැනෙනවා නම් එය ඉවත් කර ගැනීමට අදාළ මැදිහත්වීම අපේ පැත්තෙන් සිදු කරනවා. එසේම ආගම සිහි කිරීමේ කටයුතු න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට කටයුතු කරන ලෙස කියා සිටියා.නමුත් සභා රිති අනුව අප කටයුතු කරන අතර සභා රීති උපදෙස් සංග්‍රහයේ 7 වන පිටුවේ ජේදයේ මේ පිළිබදව සදහන්වනවා. ආගම ගැන අපි හැමෝටම ආධ්‍යාත්මික හැගීමක් තිබෙනවා.නමුත් සභා රීති අනුව කටයුතු සිදු කළයුතු නිසා න්‍යාය පත්‍රය මේ ආකාරයට සකස් තියෙනවා.

දේශානි මන්ත්‍රීතුමිය දහම් පාසල් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සම්බන්ධව කථා කළා.ඒ සම්බන්ධව ඉදිරියේදී සලකා බලන බව බවසා සිටිනවා.

ඊට පසු ගරු මන්ත්‍රී කුසුමාවතී මන්ත්‍රීතුමිය සොහොන් භුමි පිරිසිදු කිරීමේ කටයුතු හා පුනරුදයේ වැඩ සටහන් පිළිබඳව කථා කළා.

පද්මිණී මන්ත්‍රීතුමිය ආපදා කළමනාකරණ පුහුණු වැඩ සටහන නොපැවැත්වීම පිළිබඳවත් පත් වූ අපහසුතාවය පිලිබදවත් අදහස් ඉදිරිපත් කලා.නමුත් අපිට පළාත් පාලන ආයතනයෙන් රාත්‍රියේ දැනුම් දුන් බැවින් දැනුම් දීමට නොහැකිවීම සම්බන්ධයෙන් කණගාටුව පල කරනවා.

ගරු සිසිර දිලාන් මන්ත්‍රීතුමා මාර්ග සංවර්ධනය පිළිබඳව කථා කළා.ඊට අදාළ මැදිහත්වීම සිදු කිරීමට කටයුතු කරනවා.එසේම.වාහන නවතා තැබීමේ ගාස්තු අය කිරීම සම්බන්ධවත් කථා කළා.මේ අවුරුද්දට අදාළව ටෙන්ඩරය ලබා දී ඇති බැවින් ඊළඟ අවුරුද්දේ ඊට අදාළව තින්දු තීරණ ගැනීමට කටයුතු කරන අතර උමා ඔය දෙපස පැල සිටුවීමට ඔබතුමාගේ පැත්තෙන් විශාල මැදිහත්වීමක් සිදු කළා.එබැවින් ඒ සම්බන්ධයෙන් ඔබතුමාට මා මේ අවස්ථාවේදී ස්තූතිය පුද කර සිටිනවා.